[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 1999 දෙසැම්බර් මස 14 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

1999 දෙසැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 තැපැල් ගාස්තුව : රු. 3.50

## 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 14 වැනි දින.]

එල්.ඩී. - ඕ. 71/98.

## 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ලුහුඬු නාමය.

1. මේ පනත 1999 අංක 50 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 20 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ දෙවන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම.

(1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව. (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එම වගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :-

(ඌ) සංවර්ධන සැලසුම්වලට අනුකූලව නිශ්චිත පුහුණු වැඩසටහන් මෙහෙයවීම පිණිස පෞද්ගලික අංශයේ ආයතනවලට ගිවිසුම් යටතේ ප්‍රදාන හා සහනාධාර ලබාදීමට ;

H- 022545

(එ) වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ කරන පර්යේෂණ හා සංවර්ධන ද ක්‍රියාකාරකම් භාර ගැනීමට ;

(ඒ) වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ ක්ෂේත්‍රයේ සැලසුම් හා වෘත්තීය මාර්ගෝපදේශකත්වය සැපයීමේ කාර්යයන් සඳහා තොරතුරු එක්රැස් කිරීමට ශ්‍රම වෙළෙඳපොල පිළිබඳ තොරතුරු සැපයීමේ ක්‍රමයන් පිහිටුවීම හා පවත්වා ගෙන යාමට ;

(ඔ) වෘත්තීය නිපුණතාවයන්, පුහුණු වැඩසටහන්, පරීක්ෂණ සහ තත්ත්ව කළමනාකරණ ක්‍රමයන් සම්බන්ධ සම්මතයන් ඇතුළත්ව වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳ තත්ත්වය සහතික කිරීම සඳහා වූ ක්‍රමයන් පිහිටුවීම සහ පවත්වා ගෙන යාමට ;

(අ) එම වගන්තියේ (ඌ) ඡේදය එම වගන්තියේ (ඕ) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් .

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

කොමිෂන් සභාවේ සංයුතිය.

6. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) 10 (1) (අ) වගන්තිය යටතේ පත් කරනු ලැබූ තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) VI පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපතිවරයා ;

(ඇ) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා ;

(ඈ) කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඉ) 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඊ) අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ;

(උ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා වෘත්තීය සමිති මගින් නම් කරනු ලැබූ තැනැත්තන් අතුරින් වෘත්තීය සමිති නියෝජනය කිරීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු ;

(ඌ) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් අතුරින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කරන ලද සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් දහ දෙනෙක්, ඉන් අවම වශයෙන් තැනැත්තන් අට දෙනකුවත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය හා සේවා යෝජකයන්ගේ වෙනත් සංගම් මගින් නම් කරනු ලැබූ තැනැත්තන් විය යුතු ය.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු වේ නම් හෝ විය හැකි නම් ඔහු කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයකු වීමට නුසුදුස්සකු විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාවේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් එක් අයකු (මෙහි මින් මතු "සභාපතිවරයා" යයි සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(4) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ සෑම පත් කරන ලද සාමාජිකයෙක්ම, ඔහු එම ධුරයට පත් කරන ලද දිනයේ සිට අවුරුදු හතරක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයෙහි විධිවිධානවලට" යන වචන හා ඉලක්කම් වෙනුවට "6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඌ) ඡේදයෙහි විධිවිධානවලට" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (6) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ,10ඊ, 10උ, හා 10 ඌ වගන්ති ඇතුළත් කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 10අ, 10ආ, 10ඇ, 10ඈ, 10ඉ, 10ඊ, 10උ හා 10ඌ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය.

කොමිෂන් සභාවට රජයේ නිලධරයන් පත් කිරීම.

10අ. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවය කරනු ලබන්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද, එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් හෝ පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ආණ්ඩුව සමග ඇතිකර ගත් ගිවිසුමක් මගින් යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තකු, කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාවට කරනු ලබන සේවය ඒ එකඟත්වයේ බැඳීම් ඉටු කරලීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ අරමුදල.

10ආ. (1) කොමිෂන් සභාවට එය සතු අරමුදලක් තිබිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය :-

(අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ගාස්තු, අය කිරීම් හෝ සෙස් බදු වශයෙන් කොමිෂන් සභාවට ලබාගත හැකි සියලු මුදල් ;

(ඇ) ප්‍රදාන, ත්‍යාග හෝ ණය වශයෙන් කොමිෂන් සභාවට ලබාගත හැකි සියලු මුදල්.

(3) මෙම පනත යටතේ කොමිෂන් සභාව විසින් එහි බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි යම්තාක් සියලු මුදල් ප්‍රමාණ සහ මෙම පනත මගින් හෝ මෙම පනත යටතේ නියම කර ඇති හෝ බලය ලබා දී ඇති සියලු මුදල් ප්‍රමාණ කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ මුදල් වර්ෂය.

10ඇ. කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

කොමිෂන් සභාවේ ගිණුම් විගණනය

10 ඈ. (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව.

10ඉ. කොමිෂන් සභාවේ මුද්‍රාව -

(අ) කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට වෙනස් කළ හැකි ය;

(ඇ) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඒ වෙනුවෙන් ලිඛිතව බලය දෙනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනාම ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සැළකිය යුතු බව.

10 ඊ. කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සළකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් වශයෙන් සැළකිය යුතු බව.

10උ. කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් වශයෙන් සළකනු ලැබිය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

10ඌ. (1) (අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද හෝ ක්‍රියාවක් සඳහා කොමිෂන් සභාවට විරුද්ධව; හෝ

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය යටතේ සද්භාවයෙන් කරන ලද්දා වූ හෝ කරන ලද්දේ යයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව,

සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක් සිදු නොවිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ කොමිෂන් සභාව විසින් පවරන ලද්දා වූ හෝ ඊට විරුද්ධව පවරනු ලැබුවා වූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී

කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය. තවද, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

(3) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය පිට හෝ ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් ක්‍රියාවක් වෙනුවෙන් යම් අධිකරණයක් හමුවේ ඔහුට විරුද්ධව ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය විසින් තීරණය කරන්නේ නම් (1) වන උපවගන්තියේ (ආ)ඡේදයේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදම්, ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී, ඔහු විසින් අය කර ගෙන ඇත්තේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 12 අ වගන්තිය ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 12අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය.

"විධාන දීම සඳහා අමාත්‍යවරයාට ඇති බලය.

12 අ. අමාත්‍යවරයා විසින්, පිළිවෙලින්, කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ ආණ්ඩුව මගින් අරමුදල් සපයනු ලබන යම් කාර්මික පුහුණු හෝ වෘත්තීය අධ්‍යාපන ආයතනයක් භාර අමාත්‍යවරුන් විමසා කොමිෂන් සභාවේ සංවර්ධන සැලසුම් හා නියමු උපදෙස්වලට අනුකූලව කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා එවැනි යම් දෙපාර්තමේන්තුවකට, අධිකාරියකට සහ ආයතනයකට විධාන කරනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයකටම අනුකූලව ක්‍රියා කිරීම පිළිවෙලින් එම දෙපාර්තමේන්තුවේ, අධිකාරියේ හෝ ආයතනයේ කාර්යය විය යුතු ය.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(අඅ) වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව ලබා දෙන්නා වූ රාජ්‍ය අංශයේ ආයතන අතර අරමුදල් වෙන්කර දීම සඳහා උපමාන ; ".

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.